# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No DSD/HO/SW/14/19/01/Circular | ඔබේ අංකය<br>உமது இல<br>Your No ........................................... | දිනය<br>திகதி<br>Date 2022.04.26 |

සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති කළමනාකරුවන්,
සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති සභාපතිවරුන් වෙත.

## <u>අඩු ආදායම්ලාභී පවුල් සම්බන්ධ තොරතුරු ලබා ගැනීම</u>

උක්ත ශීර්ෂය යටතේ මා විසින් නිකුත් කරන ලද 2022.04.22 දිනැති සමාංක දරණ ලිපිය හා බැඳේ.

02. ඒ අනුව ඔබ බැංකු කලාපයට අදාළව වසම්වල වෙසෙන අඩු ආදායම්ලාභී පවුල්වල දත්ත රැස්කර CRM දත්ත පද්ධතියට ඇතුලත් කිරීම කල යුතුව ඇත. මෙහිදී,

I. මේ වන විටත් වසම් මට්ටමින් ඔබ සතුව ඇති ඉහත ලිපියෙහි ඇමුණුම් අංක 01. මගින් ඉදිරිපත් කර ඇති අඩු ආදායම්ලාභීන් ලෙස හඳුනාගෙන ඇති පවුල්වලට අදාළ නම, ලිපිනය හා පවුලේ සාමාජිකයින් සංඛ්‍යාව පමණක් ඇතුලත් කල හැකි අතර ඒ සඳහා කිසිදු පෝරමයක් භාවිතා කිරීමට අවශ්‍ය නොවේ. ඒ අනුව අමතර මුදලක් දැරීමට සිදුනොවන අතර, වර්තමානයේ රටතුල පවතින ලිපිද්‍රව්‍ය හිඟය සහ අනෙකුත් කරුණු සැලකිල්ලට ගෙන මෙම තීරණයට එළඹීමේ හැකියාව ඔබ වෙත පවතී.

II. එමෙන්ම ඇමුණුම් අංක 02.ට අනුව රැස්කරගත් තොරතුරු ලිපියෙහි සඳහන් කර ඇති නියමිත කාල සීමාව තුළ CRM දත්ත පද්ධතියට ඇතුලත් කර අවසන් කිරීමේ හැකියාවක් පවතී නම්, ඔබ සමෘද්ධි ප්‍රජාමූල බැංකු කලාපයට අදාළ අඩු ආදායම්ලාභීන්ගේ තොරතුරු ලබාගැනීම සඳහා අවශ්‍ය පත්‍රිකා රෝනියෝ, ඩුප්ලෝ හෝ ඡායා පිටපත් ගැනීම තුළින් එකී දත්ත CRM පද්ධතියට ඇතුලත් කල හැකිය.

03. ඉහත II කරුණට අදාළව කටයුතු කිරීමේදී යම් වියදමක් දැරීමට සිදුවේ නම් එම මුදල අදාළ සමෘද්ධි ප්‍රජාමූල බැංකු මගින් වියදම් කර, ප්‍රධාන කාර්යාලයේ තොරතුරු තාක්ෂණ අංශය මගින් ප්‍රතිපූර්ණය කරගත හැකි අතර, එලෙස ඇතුලත් කරනු ලබන සම්පූර්ණ පෝරමයක් සඳහා පමණක් අදාළ බැංකු කළමනාකරුගේ නිර්දේශය මත රු.5/-ක ගෙවීමක් සිදුකිරීමට කටයුතු කරනු ලැබේ.


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

04. වර්තමානයේ අඩු ආදායම්ලාභීන් මුහුණ පා ඇති ආර්ථික දුෂ්කරතාවයන් හේතුවෙන් රජය මඟින් සහන ලබාදෙන අවස්ථා වලදී අදාළ කාර්යයන් කඩිනමින් සිදු කිරීමට මෙම තොරතුරු අත්‍යවශ්‍ය බැවින් මේ කෙරෙහි අවධානය යොමුකර ඊට අදාල කටයුතු කඩිනමින් සිදු කරන මෙන් දන්වමි.

05. මේ පිළිබඳව වැඩිදුර විස්තර සමාජ ආරක්ෂණ හා සුභසාධන අංශයේ අධ්‍යක්ෂ (වැ.බ.) එච්.කේ.රණවීර මහතා දුරකථන අංක 0112-864398 මඟින්ද තොරතුරු තාක්ෂණ අංශයේ සහකාර අධ්‍යක්ෂ කේ.එන්. ජීවනී මිය හා පද්ධති විශ්ලේෂක හිරාන් ප්‍රසන්න මහතා දුරකථන අංක 0112-861213 මඟින්ද අමතා ලබාගන්නා ලෙස වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

ආර්.පී.බී. තිලකසිරි,
අධ්‍යක්ෂ ජනරාල්.

**පිටපත් :-**

01. ලේකම්, සමෘද්ධි සංවර්ධන අමාත්‍යාංශය - කා.දැ.පි.
02. සියළුම දිස්ත්‍රික් ලේකම්වරු/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරු - අ.ක.ස. / කා.දැ.පි.
04. සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරු - අ.ක.ස. / කා.දැ.පි.
05. සියළුම ප්‍රාදේශීය ලේකම්වරු - අ.ක.ස. / කා.දැ.පි.
06. ප්‍රධාන අභ්‍යන්තර විගණක - අ.ක.ස. / කා.දැ.පි.